**විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය - 2022**

**------------------------------------------------------------------------**

විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3698 එස්ආර්අයි හා 3699 එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුම්වල IV වාවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කැලණිය, රජරට, සබරගමුව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රටේ උසස් අධ්‍යාපන පද්ධතියට රැකියාභිමුඛ තාක්ෂණික උපාධි වැඩසටහන් ඇතුළත් කිරීමේ ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 26,400කට සමාන එ.ජ.ඩො මිලියන 165ක් වූ අතර ඉන් රු.මිලියන 23,200කට සමාන එ.ජ.ඩො මිලියන 145ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් ඉතිරි මුදල වන රු. මිලියන 3,200 කට සමාන එ.ජ. ඩොලර් මිලියන 20 ක් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 අප්‍රේල් 17 දින පසුගාමී මූල්‍යනය යටතේ ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන මඟින් 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, 2022 වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූල වන පරිදි විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශචය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දුස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘති සංරචක 05ක් යටතේ 2018 අප්‍රේල් 17 වන දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර ඇති අතර එය 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව ඇත. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ වී වසර 04 කුත් මාස 08ක් ගත වුවද ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 68ක් සහ සියයට 43ක් විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ සියයට 15ක ප්‍රගතියක් පමණක් ව්‍යාපෘතිය ලබාගෙන තිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ සංරචක අනුව ප්‍රගතිය පහත පරිදි වේ.

**ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය**

| | සංරචකය | 2022 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්යසාධනය | | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධනය | | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත ප්‍රගතිය (%) | ලඟාකරගත් ප්‍රගතිය (%) | අපේක්ෂිත ප්‍රගතිය (%) | ලඟාකරගත් ප්‍රගතිය (%) | | |
| (අ) | තාක්ෂණ අධ්‍යාපනය, නවෝත්පාදන සහ පර්යේෂණ සඳහා පීඨ ගොඩනැගිලි සහ පහසුකම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | 75 | 71 | 70 | 60 | කොවිඩ් 19 වසංගත තත්ත්වය සහ පසුකාලීනව සිදු වූ ආර්ථික අර්බුදය, ආනයන මත රජයේ සීමා පැනවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවල කාර්යසාධනයට අහිතකර ලෙස බලපාන ලදී.. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය කාර්ය සාධනය සතුටුදායක මට්ටමින් කළමනාකරණය කිරීමට සමත් වූ බව. | කොන්ත්‍රාත්කරුවන් ගේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ආ) | උසස් තත්ත්වයේ සහ රැකියා ඉලක්ක කරගත් තාක්ෂණික වැඩසටහන් සහ විෂයමාලා සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම | 70 | 65 | 38 | 28 | කොවිඩ් කාලසීමාව තුළ ගමන් සීමා කිරීම් සහ විශ්වවිද්‍යාලවල අධ්‍යයන සේවක සංඛ්‍යාවේ හිඟය හේතුවෙන් දිගුකාලීන පුහුණුවීම් ආරම්භ කිරීම ප්‍රමාද වී තිබුණි. ව්‍යාපෘති කාල සීමාව තුළ, ප්‍රදාන මගින් ආචාර්ය උපාධි සහ MScs 20ක් සම්පූර්ණ කිරීමට සමත් විය.<br>රජයේ සීමා කිරීම් හේතුවෙන් කෙටිකාලීන විදේශ පුහුණුවීම් අවලංගු කිරීමට සිදු වූ අතර ප්‍රධාන පුහුණු වැඩසටහනට අනුව අනෙකුත් පුහුණුවීම් සිදු කරන බව. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | ක්‍රියාත්මක කරන ආයතන සහ කර්මාන්ත සහ විදේශීය විශ්වවිද්‍යාල යන දෙකම අතර සම්බන්ධතා, සහයෝගිතා සහ හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම. | 60 | 50 | 10 | 05 | තෝරා ගැනීමේ දීර්ඝ පරිපාලන ක්‍රියාවලිය සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සහයෝගීතාවයේ අනුමැතිය ලබා ගැනීම හේතුවෙන් එය ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවන බව. | ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 ව්‍යාපෘති පරිපාලනය

| අංක | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2023 ජූලි 22 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණු අතර එය 2023 අගෝස්තු 26 දක්වා දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවට අනුව, මාස 30ක කොන්ත්‍රාත්තු කාලයෙන් මාස 24ක් ගෙවී ගියද, 2022 දෙසැම්බර් 31 වන විට ඉලක්කගත භෞතික ප්‍රගතිය වන සියයට 68 න් සියයට 25.63ක් පමණක් ලබාගෙන තිබුණි. එබැවින්, ඉතිරි මාස 7ක් වූ කොන්ත්‍රාත් කාලයෙන් සියයට 74.37 ක් වූ ඉතිරි සැලකිය යුතු කොන්ත්‍රාත් වැඩ ප්‍රමාණය ඉටු කළ යුතුය. | කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහ ගැටළුව හේතුවෙන් ඉදිකිරීම් ප්‍රගතිය ඉලක්කගත ප්‍රමාණය අනුව සිදු කිරීමට නොහැකි විය. වැඩ කරගෙන යාම සඳහා අමතර අත්තිකාරමක් ඉල්ලා ඇත. ඉල්ලීම ADB වෙත යොමු කර ඇති අතර එය සැකසෙමින් පවතින බව. | කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | රජරට විශ්ව විද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම 2021 ඔක්තෝම්බර් 25 වන දින ආරම්භ කරන ලද අතර ව්‍යාපෘති කාල සීමාව වන 2023 දෙසැම්බර් 31දිනෙන් ඔබ්බට 2024 අප්‍රේල් 24 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. ප්‍රගති වාර්තාවට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඉලක්කගත සමස්ත භෞතික ප්‍රගතිය සියයට 48ක් වුවද ඉන් සියයට 25 ක් පමණක් ලගා කරගෙන තිබුණි. ඉතිරි ඉදිකිරීම් කටයුතු නියෝජනය වන සියයට 75 මාස 16ක් ඇතුළත ඉටු කළ යුතුය. | කොවිඩ් සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ආරම්භ කිරීම ප්‍රමාද වී තිබුණි. දැන් එය ක්‍රියාත්මක වෙමින් පවතින අතර 81%ක ඉලක්කයට සාපේක්ෂව 2023 මැයි 31 වන විට 43% ක ප්‍රගතියක් ළගා කර ගෙන තිබුණි. | කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය සඳහා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2020 දෙසැම්බර් 10 වැනි දින ආරම්භ කිරීමට හා 2023 ජූනි 19 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණු අතර පසුව එය 2023 ජූලි 13 දක්වා දීර්ඝ කරන ලදී. කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට සියයට 97ක් වූ ඉලක්කගත භෞතික ප්‍රගතියෙන් සියයට 88ක භෞතික ප්‍රගතියක් ලගා කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, ඉතිරි වැඩ ප්‍රමාණය මාස හතක ඉතිරි කොන්ත්‍රාත්තු කාලය තුළ අවසන් කළ යුතුය. | ඉහත සඳහන් කළ ගැටළු හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු විය. කෙසේ වෙතත්, 2023.05.31 වන විට අපේක්ෂිත ඉලක්කය වූ 99%ට සාපේක්ෂව 96%ක තථ්‍ය ප්‍රගතියක් ලබා ගෙන තිබුණි. | කොන්ත්රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.නියමිත කාලසීමාව තුළ වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ නිසි පරිදි අධීක්ෂණය කරමින් වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.3 ඌන උපයෝජිත සම්පත්

| **විගණන ගැටලු** | **කළමනාකරණයේ අදහස් දැක්වීම්** | **විගණකගේ නිර්දේශ** |
|---|---|---|
| ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ණය දීමේ නියෝජිතායතනය විසින් ප්‍රතිපාදනය කරන ලද ඇ.ඩොලර් මිලියන 145කින් නියෝජනය වන සියයට 87.9ත් ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට 2022 දෙසැම්බර් 31ට වසර 04 මාස 8ක් ගත වී තිබුණද ඇ.ඩොලර් මිලියන 59.36කින් නියෝජනය වන සියයට 40.93ක් පමණක් භාවිත කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට භාවිතයට නොගත් ණය ශේෂය සඳහා රු. මිලියන 73.54 ට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 0.36 ක කැපවීම් ගාස්තු ගෙවා තිබුණි. එබැවින්, ඇ.ඩො. මිලියන 85.64 ක ණය ශේෂය නියෝජනය වන සියයට 59.07 භාවිතා කිරීම සහ ඉතිරි මාස 12 ක ව්‍යාපෘති කාල සීමාව ඇතුළත ව්‍යාපෘතිය අවසන් කිරීමේ හැකියාව පිළිබද විගණනයේදී සැක සහිත විය. | ඉහත සඳහන් කළ සියලු කරුණු මෙම තත්ත්වයට බලපා ඇති බව. | ව්‍යාපෘතිය අදාළ කාලය තුළ සම්පූර්ණ කිරීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |